**සේවක අර්ථසාධක අරමුදල - 2025**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සේවක අර්ථසාධක අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, සාමාජිකයන්ගේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ සහ 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි අරමුදලේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව

හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ  පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- අරමුදලේ සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කම්කරු දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව හඳුනාගෙන තිබූ රු.මිලියන 27.385 ක බැරකම් සේවක අර්ථසාධක අරමුදලේ අවසන් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ වගකීම් හා වියදම් රු.මිලියන 27.385 කින් ඌනගණනය වී තිබුණි. | සමාලෝචිත වර්ෂයේ වගකීම් හා වියදම් රු.මිලියන 27.385 කින් ඌන ගණනය වී ඇති බැරකම ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට අපේක්ෂා කරන බව. | ගිණුම්ගත වී නොමැති අරමුදලේ වගකීම් ගිණුම්ගත කිරීමටත්, ඉදිරියේදී මෙවැනි ගිණුම්ගත නොකිරීම් වැළැක්වීමට සුදුසු පාලන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛ | | | |
| | (i) 1999 පෙබරවාරි 11 දිනැති අංක 01/99 දරණ කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛය | (අ)හිඟ දායක මුදල් හා අධිභාර අයකර ගැනීම සඳහා අවසන් නිවේදනය නිකුත් කිරීමෙන් පසුවද අදාළ මුදල් ප්‍රේෂණය නොකරන සේවායෝජකයන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වුවද, අරමුදලේ අධීක්ෂණ දත්ත පද්ධතිය අනුව අවස්ථා 253 කට අදාළ රු.238,766,949 ක හිඟ මුදල් අයකර ගැනීම සඳහා මෙතෙක් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලබා දී ඇති ලිපිනයන් වැරදි වීම, ආයතනයේ ලිපිනය නම සංශෝධනය කිරීමට සිදුවීම, දත්ත පද්ධතිය යාවත්කාලීන වී නොමැති වීම නඩු පැවරීම සඳහා සේවා යෝජක සොයා ගැනීමට අපහසු වීම හා විවිධ අඩුපාඩු නිසා නිවේදන නිවැරදි කිරීම වැනි කරුණු හේතුවෙන් මෙම ප්‍රමාදයන් සිදුවී ඇත. | අයවී නොමැති දායක මුදල් හා අධිභාර ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු අතර, මෙවැනි ප්‍රමාදයන් ඉදිරියේදී ඇති නොවීමට අවශ්‍ය පාලන ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (ආ) ආයතන පරීක්ෂණ සිදුකර හිඟ දායක මුදල් හා අධිභාර අයකර ගැනීම සඳහා ප්‍රථම නිවේදන නිකුත් කර තිබුණද, අවස්ථා 67 කට අදාළව අවසන් නිවේදන (රතු නිවේදන) නිකුත් කර නොතිබූ අතර, එම ආයතන වලින් හිඟ දායක මුදල් හා අධිභාර ලෙස රු.26,383,848 ක් අයකර ගැනීමට පැවතුණි. | ඇතැම් ආයතන සඳහා අවසන් නිවේදන යැවීමට කටයුතු කර ඇති අතර අනෙක් ආයතන වල ප්‍රමාණවත් සාක්ෂි නොමැති බැවින් එම ආයතන පිළිබඳව සාක්ෂි සකස් කරමින් පවතී. | අදාළ සාක්ෂි කඩිනමින් සම්පූර්ණ කර, හිඟ දායක මුදල් හා අධිභාර අයකර ගැනීම සඳහා අවසන් නිවේදන නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |
| | (ඇ)කම්කරු නිලධාරීන් විසින් සිදුකරන පරීක්ෂණවලදී සේවායෝජකයන් විසින් සේවකයන් වෙනුවෙන් දායක මුදල් ගෙවා නොමැති බව අනාවරණය වූ විට, එම දායක මුදල් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි පරීක්ෂණ අවස්ථාවේදීම රැස්කර ගත යුතු වුවද, බටහිර කොළඹ බලප්‍රදේශයේ හෝටල් කර්මාන්තයකට අදාළව එසේ සාක්ෂි රැස්කර තිබුණේ එක් සේවකයෙකු සම්බන්ධයෙන් පමණක් විය. අනෙකුත් සේවකයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි රැස්කර නොතිබුණු අතර රු.438,003,820 ක හිඟ දායක මුදල් අයකර ගැනීමට පැවතුණි. | පළමු හා රතු නිවේදන යවා ඇති අතර ඒ සඳහා ආයතන විසින් දැනට ගෙවීම් කර නොමැති බැවින් ආයතනයට විරුද්ධව නඩු දැමීමට කටයුතු යොදා ඇත. මෙම ආයතනය වෙත නිකුත් කරන ලද නිවේදන සඳහා නොගෙවා ඇති සේ.අ.අ. අරමුදල් විශාල ප්‍රමාණයක් දැනට අයකර ඇති අතර, අයකර ගැනීමට නොහැකි අනිකුත් නිවේදන සඳහා ද නඩු දැමීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. | හිඟ දායක මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය සාක්ෂි පරීක්ෂණ අවස්ථාවේදීම සම්පූර්ණයෙන් රැස්කර, අදාළ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) 2000 පෙබරවාරි 10 දිනැති අංක 6/2000 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 1(IV) ඡේදය | අරමුදලේ අධීක්ෂණ දත්ත පද්ධතියට අනුව දිස්ත්‍රික් කම්කරු කාර්යාල බලප්‍රදේශ 06කට අදාළව සක්‍රීය ආයතන 41,207ක් පැවතුණි. දිගු කාලයකින් පරීක්ෂාවට ලක් නොවූ ආයතන පරීක්ෂාව සඳහා තෝරාගත යුතු බවට චක්‍රලේඛ මඟින් උපදෙස් ලබා දී තිබුණද, පරීක්ෂාවට ලක් කර තිබුණේ ආයතන 8,950ක් පමණි. ඒ අනුව, සක්‍රීය ආයතන 32,257ක් හෙවත් සමස්ත සක්‍රීය ආයතන සංඛ්‍යාවෙන් සියයට 78කට ආසන්න ප්‍රමාණයක් 2000 | කම්කරු නිලධාරියකු විසින් මසකට ආයතන 20ක් හෝ ඊට වැඩියෙන් පරීක්ෂා කරන අතර, එම ආයතන අතරින් අක්‍රිය ආයතන 10 ක් සහකාර කම්කරු කොමසාරිස් විසින් තෝරා පරීක්ෂාවට ලබා දෙයි. උසාවි රාජකාරි යෙදීම,අමතර ආයතන පරීක්ෂාව, කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම් ආයතන පරීක්ෂා කිරීම, දින 05 සේවා මුර පරීක්ෂා | දිගුකාලයකින් පරීක්ෂාවට ලක් නොවූ ආයතන කඩිනමින් පරීක්ෂා කර, සියලු ආයතන කාලීනව පරීක්ෂාවට ලක්වන පරිදි විධිමත් වැඩපිළිවෙළක් හඳුන්වා දිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සිට 2025 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පරීක්ෂාවට ලක් කර නොතිබුණි. | කිරීම් ආදී කටයුතු පැවරෙන අවස්ථාවන්හි මෙම ආයතන 10 පරීක්ෂා කිරීමේ ප්‍රමාදයන් ඇති වේ. | |
| | (iii) 2017 සැප්තැම්බර් 21 දිනැති අංක 05/2017 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛය | කම්කරු නිලධාරීන් විසින් සිදුකරන ලද වාරිකා පරීක්ෂණ වලදී අනාවරණය වූ හිඟ දායක මුදල් හා අධිභාර වාරික වශයෙන් ගෙවීමට සේවායෝජකයින් වෙත සහන ලබා දී තිබියදීත් අදාල මුදල් නොගෙවූ අවස්ථා නිරීක්ෂණය විය. නියැදි පරීක්ෂාව අනුව, සහන අවස්ථා 83කට අදාළව ලැබිය යුතු රු.376,695,619කින් රු.94,375,391ක් 2025 දෙසැම්බර් 31 දින වන විටත් අයවීමට පැවති අතර, එම මුදල් අයකර ගැනීම සඳහා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දත්ත පද්ධතිය ඇසුරු කරගෙන වාරික මඟහැරීම් සහ අනෙකුත් අතපසුවීම් සහිත ආයතන සම්බන්ධව ප්‍රමුඛතාවයක් සහ විශේෂ අවධානයක් යොමු කරමින් කටයුතු කිරීමට උපදෙස් දැනටමත් ලබාදී ඇත. | අය නොවී පවතින දායක මුදල් හා අධිභාර කඩිනමින් අයකර ගැනීමටත්, ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 1981 අංක 26 දරන සේවක අර්ථසාධක අරමුදලේ (සංශෝධන) පනතේ 03 වන වගන්තිය | නියමිත දිනට දායක මුදල් නොගෙවන සේවායෝජකයන්ගෙන් එම ප්‍රමාද කාලය වෙනුවෙන් අධිභාර මුදලක් අය කර ගත යුතු වුවද, 2025 ජුනි 19 දින ශ්‍රී ලංකා මහ බැංකු දත්ත පද්ධතිය ආශ්‍රිතව සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී, ගම්පහ කලාපයට අදාළව 2024 වර්ෂය සඳහා සේවායෝජක ආයතන 30 කින් එකතුව රු.33,076,906 ක අධිභාර මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නොගෙවා ඇති අධිභාර අයකර ගැනීමට අදාල සහකාර කම්කරු කොමසාරිස්වරුන් වෙත උපදෙස් ලබා දී ඇත. | අයවිය යුතු අධිභාර මුදල් කඩිනමින් අයකර ගැනිමටත්, ඉදිරියේදී එවැනි අධිභාර අය නොවී පැවතීම වැළැක්වීමටත් විධිමත් පසු විපරම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 23(ඇ) වන වගන්තිය | සාමාජිකයා “ලංකාවට ආපසු නොඑන අදහසින්” විදේශගත වන බවට අවශ්‍ය තහවුරු කිරීම් සිදුකර ප්‍රතිලාභ ගෙවිය යුතු වුවද, එම කොන්දේසිය නිසි පරිදි තහවුරු කර නොගෙන අවස්ථා 6 කදී එකතුව රු.18,855,603 ක | අවශ්‍ය දැනුවත්භාවය නිලධාරීන් සතුව තිබී නොමැති බවත් මේ වන විට අදාල ලේඛණ නිසිපරිදි පරීක්ෂා කිරීමට කටයුතු කරනු ලබයි. | අදාළ නීතිමය අවශ්‍යතා හා ලේඛන නිසි පරිදි තහවුරු කිරීමෙන් පසුව පමණක් ප්‍රතිලාභ ගෙවීමටත්, අදාළ මාර්ගෝපදේශ |

| | | |
|---|---|---|
| | ප්‍රතිලාභ ගෙවා තිබුණි. තවද, ස්ථිර පදිංචිය සඳහා විදේශගත වීමේදී අවශ්‍ය සංක්‍රමණික වීසා පිටපත් නිසි පරිදි තහවුරු කර නොගෙන ප්‍රතිලාභීන් 4 දෙනෙකු සඳහා එකතුව රු.13,463,896 ක ප්‍රතිලාභ ගෙවා තිබුණි. | යාවත්කාලීන කර නිලධාරීන් නිරන්තරයෙන් දැනුවත් කිරීමටත්, එවැනි දෝෂ වැළැක්වීම සඳහා ප්‍රමාණවත් පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 549,821 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 511,063 ක් විය. ඒ අනුව මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.මිලියන 38,758ක වර්ධනයක් නිරීක්ෂණය විය. අරමුදලෙහි පොළී ආදායම හා ලාභාංශ ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් රු.මිලියන 51,828 කින් හා රු.මිලියන 1,108 කින් වර්ධනය වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය උපකරණවල සාධාරණ අගය ගැලපීම මත රු.මිලියන 14,354ක අලාභයක් හඳුනාගෙන තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 වර්ෂයේ දී ගුවන් සමාගමක් වෙත කරන ලද රු.මිලියන 500 ක ආයෝජන සඳහා මේ දක්වාම කිසිදු ආදායමක් අරමුදලට ලැබී නොතිබුණ අතර 2021 දෙසැම්බර් 31 දින ආයෝජනය කර තිබූ මූල්‍ය සමාගමක බලපත්‍රය අවලංගු කිරීම හේතුවෙන් අරමුදලට රු.මිලියන 205.49 ක් අහිමි වී තිබුණි. | ගුවන් සමාගම රාජ්‍ය හිමිකාරීත්වය යටතේ පවතින සමාගමක් වන අතර, දීර්ඝකාලීනව පාඩු ලැබීම හේතුවෙන් මහා භාණ්ඩාගාරය හරහා ලබා දෙන මූල්‍ය ප්‍රතිපාදන මත නඩත්තු වන බව හා මූල්‍ය සමාගමෙහි බලපත්‍රය අවලංගු කිරීමෙන් පසු, කොළඹ වාණිජ මහාධිකරණය විසින් එම සමාගම ඈවර කිරීමට නියෝග කර ඇත. | ආයෝජන සිදු කිරීමේදී අවදානම් හා ප්‍රතිලාභ නිසි ලෙස ඇගයීමට ලක් කර, අරමුදලේ මුදල් සුරක්ෂිතව හා ඵලදායීව ආයෝජනය කළ යුතු අතර, අහිමි වූ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | අරමුදලේ බැංකු සැසඳුම් ප්‍රකාශනවල 2001 වර්ෂයේ සිට පැවත එන රු.මිලියන 101ක් වූ නොසැසඳුනු බැංකු ගිණුම් ශුද්ධ ශේෂ එකතුවක් නිරවුල් කරන තෙක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වගකීමක් ලෙස දක්වා තිබූ අතර මෙම ශේෂ නිරවුල් කිරීම සම්බන්ධයෙන් 2020 ජනවාරි 09 දින පෞද්ගලික ආයතනයක් සමඟ | මූලිකව සැලසුම්කල ක්‍රමවේදයේ ඇතිවූ ගැටළු හේතුවෙන් අපේක්ෂිත කාලය තුල අරමුණ ලඟා කර ගත නොහැකි වූ අතර ඒ සඳහා නව ප්‍රවේශයක් ලෙස ඊට අදාල බැංකු වාර්තා සහ අභ්‍යන්තරික දත්ත වඩාත් ස්වාධීන ක්‍රමවේදයකින් ලබා ගැනීමට යොමු විය. මේ වන විට, අපගේ අධීක්ෂණයට යටත්ව එම ආයතනය විසින්, තව දුරටත් ඉතිරි වී | ගිවිසුම්ගත කාර්යයන් කාලීනව සම්පූර්ණ කිරීම සඳහා විධිමත් පසු විපරම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොසැසඳුනු බැංකු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම්ගත දින සිට සති 08 ක් ඇතුළත අවසන් වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවද, ගිවිසුමට එළඹී වසර කිහිපයක් ගතව තිබියදීත් අදාළ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු මෙම වාර්තාවේ දින වන විටත් සම්පූර්ණයෙන් ඉටු කරගෙන නොතිබුණි. එසේම, 2020 දෙසැම්බර් 31 දින වන විට ගිවිසුම්ගත මුදලින් සියයට 50 ක්, එනම් රු.මිලියන 1.5 ක් අදාළ ආයතනය වෙත ගෙවා තිබුණි. | ඇති ශේෂ සම්බන්ධයෙන් නිරවුල් කිරීමට අදාළ කටයුතු කරගෙන යමින් පවතී. | |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2025 දෙසැම්බර් 31 දිනට සේවායෝජකයින්ගෙන් නඩු මගින් අයකර ශ්‍රී ලංකා මහ බැංකුවේ රඳවා තිබූ රු. මිලියන 8,048 ක්, කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමේ රඳවා තිබූ රු.මිලියන 220 ක් සහ "ජංගම වර්ෂයේ දායක මුදල් අංක 01" ගිණුමේ පැවති මුදල් පදනමින් වූ රු.මිලියන 14,778 ක් අදාළ සාමාජික ගිණුම්වලට බැර කර නොතිබුණි. තවද, විවිධ හේතූන් මත නිරවුල් නොකළ ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ රු.මිලියන 575 ක්, ඌන/අතිරික්ත දායක මුදල් රු.මිලියන 1,686 ක් සහ ඌන/අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් රු.මිලියන 516 ක් ද පැවති අතර, මෙම ශේෂයන් කඩිනමින් නිරවුල් කරන ලෙස 2013, 2016 හා 2017 වර්ෂවලදී රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ද නියෝග කර තිබුණි. ඒ අනුව, දිගුකාලයක් තිස්සේ සාමාජික ගිණුම්වලට බැර නොකර හා නිරවුල් නොකර පවතින සැලකිය යුතු මුදල් ශේෂයන් පැවතීම නිරීක්ෂණය විය. | "සී" වාර්තා රහිතව යොමු කළ දායක මුදල් මෙන්ම අසම්පූර්ණ හෝ විෂමතා සහිත "සී" වාර්තා සමඟ යොමු කළ දායක මුදල් පැවතීම ආදී විවිධ හේතු මත මෙම ශේෂයන් කේවල ගිණුම්වලට බැර කිරීමෙහි අපහසුතා පවතී.<br>මෙම ශේෂ නිරාකරණය කිරීම සඳහා, සාමාජික නම් හා අංක විෂමතා සහිත දායක මුදල් විස්තර වාර්තා පිළිබඳව සේවායෝජකයන් දැනුම්වත් කිරීම, දෝෂ සහිත "සී" වාර්තා, මංගත ක්‍රමය හරහා මුදල් විස්තර වාර්තා රැස් කිරීම, ස්වයංක්‍රිය සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයන් හඳුන්වා දීම ආදී ක්‍රියාමාර්ග ගෙන ඇත. | සාමාජික ගිණුම්වලට බැර නොකර හා නිරවුල් නොකර පවතින මුදල් ශේෂයන් හඳුනාගෙන, ඒවා අදාළ සාමාජික ගිණුම්වලට කඩිනමින් බැර කිරීමටත්, ඵලදායී පසු විපරම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීමේදී භාවිත කරනු ලබන අභ්‍යන්තර උපදෙස් මාලාව වර්තමාන නීති හා නියමයන්ට අනුකූලව යාවත්කාලීන කර නොතිබීම හේතුවෙන්, ප්‍රතිලාභ ගෙවීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය සහ පරීක්ෂා කළ යුතු ලේඛන සම්බන්ධයෙන් විධිමත් හා යාවත්කාලීන උපදෙස් මාලාවක් නොපැවති බව නිරීක්ෂණය විය. | ප්‍රතිලාභ ගෙවීමේදී භාවිත කරනු ලබන අභ්‍යන්තර උපදෙස් මාලාව වර්තමාන නියමයන්ට ගැලපෙන පරිදි සකස් කිරීමට අවධානය යොමුකර ඇත. | වර්තමාන නීති හා නියමයන්ට අනුකූලව විධිමත් හා යාවත්කාලීන උපදෙස් මාලාවක් සකස් කර, අදාළ නිලධාරීන් දැනුවත් කිරීමටත්, අවශ්‍ය පරිදි එය නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමටත් කටයුතු කළ යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ 4, 5 හා 6 මහල්වල නවීකරණ කටයුතු සඳහා උපදේශන සේවා වෙනුවෙන් රු.මිලියන 12.775 ක් ඇස්තමේන්තු කර තිබූ අතර, 2007 උපදේශන සේවා මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.14.3 මාර්ගෝපදේශය ප්‍රකාරව, උපදේශන සේවා ප්‍රසම්පාදන කමිටුවක් පිහිටුවා එහි එකඟතාවය ලබා ගැනීමෙන් තොරව හා තරගකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව උපදේශන සේවා සැපයීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව තෝරාගෙන තිබුණි. | අදාල කාර්යයන් ඉටු කිරීමට දෙපාර්තමේන්තුව තුළ විශේෂඥ දැනුම සහිත ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැති බැවින් විශේෂඥ නිපුණතාවයන් සහිත කාර්යය මණ්ඩලයකින් යුත් රජයේ දෙපාර්මේන්තුවක් වන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙතින් ඉහත කාර්යයන් ඉටුකරගෙන ඇත. මෙම කාර්යය සඳහා 2021 වර්ෂයේ දි ඇස්තමේන්තු සකස් කර ඇති අතර එම ඇස්තමේන්තුවලට අනුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් උපදේශන සේවා සඳහා අයකරනු ලබන ගාස්තුව මුළු පිරිවැය ඇස්තමේන්තුවෙන් 5%කි. එම වටිනාකම රු. මිලියන 9.5 ක් පමණ වේ. එබැවින් උපදේශන සේවාව ලබා ගැනීම සඳහා බාහිර ආයතනයක් තෝරාගෙන නොතිබුණි. ඉදිරි ව්‍යාපෘති සඳහා උපදේශන මාර්ගෝපදේශ සංග්‍රහය 3.14.3 අනුව කටයුතු කරන බව දන්වා සිටිමි. | උපදේශන සේවා ලබාගැනීමේදී අදාළ උපදේශන සේවා මාර්ගෝපදේශ හා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි නිසි පරිදි අනුගමනය කර, ප්‍රසම්පාදනයන් විධිමත්ව සැලසුම් කර අරමුදල් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ | කම්කරු දෙපාර්තමේන්තුවෙහි 2025.12.31 වන විට සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව ඉතා ඉහළ අගයක් ගැණිනි. | අරමුදලේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු ප්‍රමාණවත් අභ්‍යන්තර |

අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරනු ලබන බව දන්වා තිබුණද, 2025 වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන්, රු.ට්‍රිලියන 4.8 කට ආසන්න සාමාජික අරමුදලක් කළමනාකරණය කරනු ලබන එම දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන ක්‍රියාවලියක් ක්‍රියාත්මක වූ බව තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද, අරමුදලේ පරිපාලන කටයුතු සම්බන්ධ විගණන කටයුතු මෙහෙයවන කම්කරු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 17 ක් වුවද, 2025 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 6 දෙනෙකුට සීමා වී තිබීම හේතුවෙන් අරමුදලේ පරිපාලන කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියද ප්‍රමාණවත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අභියෝග පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව, අරමුදලේ අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය හා අභ්‍යන්තර පාලන පද්ධතිය තවදුරටත් ශක්තිමත් කිරීම අවශ්‍ය වන බව නිරීක්ෂණය විය.

දෙපාර්තමේන්තුව වෙතින් සපයන මහජන සේවාවන් අඛණ්ඩව පවත්වා ගැනීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් විවිධ කාර්යාල හා අංශ සඳහා යෙදවීමට සිදුවීම මත කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීමට සිදුවිය. ඒ හේතුවෙන් අභ්‍යන්තර විගණන අංශයෙහි පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ හැකියාවක් නොපැවතුණි. අදාළ පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ලිඛිතව දැනුවත් කර ඇත.

2025 වර්ෂයට අදාලව කම්කරු දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර විගණන අංශයෙන් විගණන වාර්තා 22ක් නිකුත් කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු 2024 වර්ෂය අවසාන වන විට, විගණනයන් 5 කට අදාළ නිර්දේශ ලැබීමට නියමිතව තිබූ අතර, මෙම විගණනයන් 2025 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණය යටතේ පැවති ඇත.

මීට අමතරව, 2024 වර්ෂය අවසාන වන විට, සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ කාර්යභාර්යන්ට අදාළ විගණන කමිටු තීරණ /නිර්දේශ 10 ක් අදාළ නිර්දේශ ලැබීමට නියමිතව තිබූ අතර, මෙය 2025 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණය යටතේ පැවති ඇත.

විගණනයකට ලක් වන බව සහතික කිරීමට විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. එම අභ්‍යන්තර විගණන වාර්තා කාලීනව විගණනය සඳහා ඉදිරිපත් කිරීමටත්, අරමුදලේ පරිපාලන කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණන කාර්යයන් ඵලදායීව ඉටු කිරීම සඳහා අවශ්‍ය මානව හා අනෙකුත් සම්පත් ප්‍රමාණවත් ලෙස සලසා දීමටත් කටයුතු කළ යුතුය.